**ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඩෙල්ෆ් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව භාවිතා කරනු ලබන වාහන 05 ක වටිනාකම තක්සේරු කර අවසන් ගිණුම්වල ඇතුළත් කර නොතිබුණි. | වාහන වටිනාකම තක්සේරු කර පොත්වල දැක්විය යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| | X පරිච්ඡේදයේ 193 වගන්තිය | වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | සභාවේ හිටපු සභාපතිවරයෙකුට ලබා දී තිබූ රු.156,215 ක් වටිනා තත්කාර්ය අත්තිකාරම් පසුගිය වර්ෂ 18 ක් පුරා නිරවුල් කර නොතිබුණි. | නියමිත රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගෙන තිබුණත් අයකර ගත නොහැකි වී ඇත. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.547,672 ක් වටිනා කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නියමිත රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | කල් ඉකුත් වූ තැන්පතු සම්පූර්ණයෙන්ම නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඈ) | උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 06 කට ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | මෙම වාහන සඳහා ඉන්ධන පරිභෝජනය පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 2017 මාර්තු 07 දිනැති අංක PE/01/2017 දරන චක්‍රලේඛය | වගකිව යුතු හෝ අධිකාරී බලය පැවරීමෙන් වගකීම් පවරා ඇති නිලධාරීන් විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | වගකිව යුතු නිලධාරීන්ගෙන් වාරික වශයෙන් ඇප මුදල් අයකරමින් පවතී. |

## 2 මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.42,925 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.5,505,060 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 950,000 | - | 70,550 | - | 80,000 | - | 47,750 | - |
| හා බදු කුලී | 1,026,000 | - | 863,250 | 132,149 | 884,800 | - | 1,441,720 | 152,050 |
| බලපත්‍ර ගාස්තු | 117,500 | - | 189,299 | - | 83,500 | - | 620,210 | 7,190 |
| වෙනත් ආදායම් | 5,559,400 | - | 4,782,461 | 765,955 | 1,582,250 | - | 3,134,986 | 2,755,190 |
| එකතුව | **7,652,900** | **-** | **5,905,560** | **898,104** | **2,630,550** | **-** | **5,244,666** | **2,914,430** |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.5,244,666 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.5,905,560 කින් වැඩි වීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.660,894 කින් වැඩි වී තිබූ බව නිරීක්ෂණය විය. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | මින් ඉදිරියේදී ආදායම් බිල් කර රැස්කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාව විසින් පසුගිය වර්ෂ 05 ක් පුරා බිල් නොකිරීමෙන් අදාළ ආදායම් පිළිබඳ හිඟහිටි ප්‍රමාණය තහවුරු කරගත නොහැකි වී තිබුණි. | සභාවේ ආදායම් බිල් කර රැස්කිරීමට කටයුතු කළ යුතු වේ. | මින් ඉදිරියේදී ආදායම් බිල් කර රැස්කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.30,550 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් හිඟ කඩ කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හිඟ බදු රු.101,600 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් හිඟ බදු කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීමට කටයුතු කරමින් පවතී. |

### 2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින විදුලි සංදේශ කුළුණු සඳහා ව්‍යාපාර බලපත්‍ර ගාස්තු රු.88,000 ක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් විදුලි සංදේශ කුළුණු සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතු වේ. | බලපත්‍ර ගාස්තු ගෙවන ලෙසට ලිපි යවා ඇත. |

**2.2.5 අනෙකුත් ආදායම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අනෙකුත් ආදායම් හිඟ මුදල් රු.764,955 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් අනෙකුත් ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | **බලපත්‍ර ගාස්තු ගෙවන ලෙසට ලිපි යවා ඇත.** |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය සහ ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරණු පහත සඳහන් පරිදි විය.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා සකස් කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි. | අදාළ ආඥා පනත අනුව කටයුතු සිදු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් සකස් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය රැස්කිරීම සඳහා නිශ්චිත ප්‍රදේශයක් තෝරාගෙන තිබුණද, ජාතික ප්‍රතිපත්ති ප්‍රකාරව ඝන අපද්‍රව්‍ය වෙන් කිරීමකින් තොරව රැස් කරනු ලබන අතර කසළ බැහැර කරනු ලබන ස්ථානවල දෛනිකව රැස්කෙරෙන කසළ කැබැලි කර පස් දමා වසා නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය වෙන් කර රැස් කළ යුතු අතර ඒවා බැහැර කරන ප්‍රදේශයන්හි කැබැලි කර පස් දමා වැසීම කළ යුතු වේ. | ඝන අපද්‍රව්‍ය රැස් කිරීම සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ii) | ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී ආවරණය කළ වාහන භාවිතා නොකර විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් මාර්ගවල ගමන් කරන ජනතාවට සෞඛ්‍ය සම්බන්ධ ගැටළු ඇති වී තිබූ අතර ප්‍රමාණයට අධිකව කසළ ප්‍රවාහනය කිරීම නිසා කසළ මාර්ගය පුරා වැටී තිබුණි. | අපද්‍රව්‍ය රැස්කිරීමේදී පරිසරයට බලපෑම් සිදු නොවන පරිදි ආවරණය කළ වාහන භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | අවම ප්‍රමාණයක කසළ එකතුවන නිසා විවෘත වාහනවල රැගෙන යනු ලැබේ. |
| (iii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. | වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීමට සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී වෙත ඉල්ලීම් කර ඇත. |

(ඇ) **පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වේ. | වර්තමානයේ මැසි තෙල් ඉසීම කරනු ලබයි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු සුසාන භූමි 06 කින් මළ සිරුරු පිළිස්සීම සඳහා අනුමැතිය ලබා නොමැති අතර ඒ සඳහා සුසාන භූමි බදු ද අයකිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සභාව එහි ආදායම් නියමිත අයුරින් අයකර ගත යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින දේපල සඳහා නැවත තක්සේරු කිරීම් සිදුකර වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | දේපල නැවත තක්සේරු කළ යුතු වේ. | ඩෙල්ෆ් ප්‍රදේශය දේපල බදු අයකිරීමට සුදුසු නොවන බැවින් වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් නියමිත පරිදි මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 11 ක් විසින් ඉටු කළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ භාවිතයේ පවතින වාහන 16 ක අයිතිය මාරු කිරිමට කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහනවල අයිතිය මාරු කිරිම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

### 3.4.2 නිෂ්කාර්ය වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ජලය සැපයීමේ බවුසරයක් පසුගිය වර්ෂ 06 ක් පුරා භාවිතයකින් තොරව පැවතුණි. | සභාවේ වත්කම් ඵලදායි ආකාරයෙන් භාවිතා කළ යුතු වේ. | අදාළ බවුසරය ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. |

### 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවාවන් සඳහා සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශයේ සඳහන් පරිදි සෑම වර්ෂයක් සඳහාම ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව සකස් කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ අයවැය ඇස්තමේන්තුවේ පුනරාවර්තන වියදම් මත ගමන් වියදම්, මූලධන වත්කම් අලුත්වැඩියා සහනාධාර හා උපකාර මුදල්, විශ්‍රාම වැටුප් ආදිය තථ්‍ය වියදම්වලින් වැඩි ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. මේ නිසා අයවැය එක් ඵලදායී නොවූ එකක් ලෙස දක්නට ලැබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |